# නිකවැරටිය, හල්මිල්ලෑව ප්‍රදේශය ඇසුරින් පාරම්පරික අලුත් සහල් මංගල්‍යය සහ එහි වර්තමාන ස්වභාවය පිළිබඳ විමර්ශනයක්

ආර්.පී.ඩී.කේ රාජපක්ෂ[1], ඩබ්.එම්.පී.පී. වන්නිනායක[2]

කෙත, වැව හා දාගැබ ඇසුරින් වැඩුණු සිංහල සභ්‍යත්වය ගොවිජන උරුමය විදහා දක්වන්නකි. සිංහලයන්ගේ ආචාරධර්ම හා සාරධර්ම අතරට ගොවිතැන ආශ්‍රිත පුද පූජා රැසක් ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල නොයෙක් මුහුණුවරින් අලුත් සහල් මංගල්‍යය පවත්වන අතර එහිදී ගොවි ජනතාව නොඉඳුල් සහලින් තෙරුවන්ට හා දෙවියන්ට කිරි ආහාර පූජාකර ගොවිතැනේ ආරක්ෂාව හා සශ්‍රීකත්වය අපේක්ෂා කරයි. එහෙත් වර්තමාන ආර්ථික, දේශපාලන, සමාජීය හේතුන් මත අලුත් සහල් මංගල්‍යයේ චාරිත්‍ර වාරිත්‍රයන් පාරම්පරික සම්ප්‍රදාය තුළින් ගිලිහී යන ආකාරය දැකිය හැකිය. ඒ අනුව මෙහි අලුත් සහල් මංගල්‍යය තුළ සිදු වී ඇති පරිවර්තනය, එහි නූතන ස්වභාවය කෙරෙහි බලපා ඇති හේතු සහ ඒ හා බැඳුණු සාම්ප්‍රදායික සිරිත් විරිත් වර්තමානය දක්වා කෙසේ විකාශනය වී ඇත් ද? යන්න නිකවැරටිය, හල්මිල්ලෑව ප්‍රදේශය ඇසුරින් අධ්‍යයනය කෙරේ. මෙම පර්යේෂණය සිදු කිරීමේදී අධ්‍යයන ප්‍රදේශය තුළ නිරීක්ෂණය හා දත්තදායකයින් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී. හල්මිල්ලෑව ප්‍රදේශයේ අලුත් සහල් මංගල්‍යය පවත්වනු ලබන්නේ ගම්බාර දෙවියන් හා අයියනායක දෙවියන් මුල් කරගෙනය. අතීතයේ දී ගම් මුලාදෑනිවරයාගේ ප්‍රධානත්වයෙන් වෙල් විදානේ විසින් අලුත් සහල් මංගල්‍යයෙහි පුද පූජා කටයුතු සිදුකළ අතර වර්තමානයේ ගොවි සංවිධානයෙහි මූලිකත්වයෙන් එය සිදු කරනු ලැබේ. මුල් කාලයේදී කිරි ඉතිරවීමට අවශ්‍ය සහල් ඇතුළු අනෙකුත් ද්‍රව්‍යය ප්‍රධාන කපු මහතාගේ නිවසේ සිට වැව් බැම්ම වෙත රැගෙන එන්නේ හේවිසි මධ්‍යයේ වුවත් වර්තමානයේ නියම කරගත් දිනයට අලුත් සහල් ඇතුළු අනෙකුත් ද්‍රව්‍යය ගොවියන් විසින් ඇළ පාමුලට රැගෙන එනු ලැබේ. නියමිත කන්නයේ අස්වනු නෙළා සති දෙකකට පසුව සිදු කරනු ලැබූ මෙම චාරිත්‍රය වර්තමානයේ මැයි සහ නොවැම්බර් යන මාසයන්හි ප්‍රදේශයේ ගොවි සංවිධානය විසින් යොදාගත් දිනයක දී පවත්වයි. වර්තමානයේ කෘෂිකර්මාන්තය හා සබැඳි නවීන තාක්ෂණයත් නූතන පරම්පරාව ගොවිතැන කෙරෙහි යොමු වීමේ ප්‍රවණතාවය අවම වීමත් හේතුවෙන් අභිචාර පිළිබඳ විශ්වාසය ක්‍රමයෙන් ගිලිහී ගොස් ඇත. වර්තමානයේ අලුත් සහල් මංගල්‍යය තුළ පැවති පැරණි චාරිත්‍ර නිකවැරටිය, හල්මිල්ලෑව ප්‍රදේශයේ සුළු වශයෙන් දක්නට ලැබුන ද සාම්ප්‍රදායික සිරිත්විරිත් වලින් මිදී පුද්ගල පහසුව උදෙසා පැවති පිළිවෙත් සකස් වීමත් කිරීමක් දැකිය හැකිය.

ප්‍රමුඛ පද ඃ අලුත් සහල් මංගල්‍යය, ගොවිතැන, චාරිත්‍ර, වර්තමානය, අතීතය

[1 2] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. dinud0120@gmail.com